# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM)

# කොළඹ විශ්වවිද්‍යාලය

## අයදුම්පත් / නාම යෝජනා සඳහා ආරාධනයයි

## අධ්‍යක්ෂක තනතුර

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) හි කළමනාකරණ මණ්ඩලය / පාලනාධිකාරිය විසින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත හා ඒ අනුගාමී සංශෝධන ප්‍රකාරව සහ 1980 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥා පනත සහ ඒ අනුගාමී සංශෝධනද ප්‍රකාරව සහ 2022 මැයි මස 23 වන දින දතම් හා අංක 10/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය හි ප්‍රතිපාදන / විධිවිධාන ප්‍රකාරව කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ හි අධ්‍යක්ෂක තනතුර සඳහා අයදුම්පත් / නාම යෝජනා කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් / නම් කරනු ලැබුවන් (නාමිකයින්) සතුව වෛද්‍ය විද්‍යා සුවිශේෂීතාවයක ආචාර්ය උපාධියක් (PhD) හෝ සමාන සුදුසුකමක් හෝ මාණ්ඩලික සහතිකකරණයක් තිබිය යුතුය. අයදුම්කරුවන් / නාමිකයින් ශ්‍රී ලාංකීය පුරවැසියන් විය යුතුවන අතර, වයස අවුරුදු 63 කට අඩු අය විය යුතුය. එසේම ඔවුන් 2023 අප්‍රියෙල් මස 01 වන දින සිට බලපවත්වන නව පත්වීම භාරගෙන කළමනාකරණ කටයුතු ඉටුකිරීමට සහ අවැසි නායකත්වය සැපයීම සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද තිබිය යුතුය. අධ්‍යාපනික සහ පරිපාලන ක්ෂේත්‍රවල පෙර පළපුරුද්ද සහිත වීම වාසිදායක වනු ඇත. PGIM හි අධ්‍යක්ෂක වරයා එම ආයතනයේ පූර්ණ කාලීන සේවා නිලධාරියෙකු සහ ප්‍රධාන / මූලික විධායක නිලධාරියා සහ ප්‍රධාන විද්‍යාර්ථී නිලධාරියා ද සහ PGIM හි ගණන් දීමේ නිලධාරියා ද විය යුතුය. තනතුරේ කාල සීමාව වසර තුනක් (03) වනු ඇත. ඔහු / ඇය PGIM හි එක් එක් අධ්‍යයන මණ්ඩලයේ සහ කළමනාකරණ මණ්ඩලයේ නිල බලයෙන් සාමාජිකයෙකු / සාමාජිකාවක වන්නේය.

**අයදුම්පත් / නාම යෝජනාද සමග පහත සඳහන් ලිපි ලේඛන ද ඉදිරිපත් කළ යුතුය.**

I. අයදුම්කරුගේ / නාමිකයාගේ උපන් දිනය (උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය) සහ විමසුම් විස්තරද ඇතුළුව ඔහු / ඇයගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු (CV) ආධාරක ලිපි ලේඛන ද සමග ඉදිරිපත් කළ යුතුය.

II. ආයතනයේ සංවර්ධනය සඳහා වන දැක්මේ පුද්ගල ප්‍රකාශයක්

III. අධ්‍යක්ෂක තනතුරට පත්කරනු ලැබුවහොත් අයදුම්කරු / නාමිකයා විසින් සක්ෂාත් කර ගැනීමට යෝජනා කරනු ලබන කරුණු කාරණා පිළිබඳ ලුහුඬු විස්තරයක්.

IV. වර්තමානයේ මෙකී තනතුර දරන අධ්‍යක්ෂක වරයා / වරියද අයදුම්කරුවෙකු වන්නේ වී නම් ඔහුගේ / ඇයගේ ප්‍රථම ධූර කාලය තුළ අත්පත් කර ගනු ලැබූ ජයග්‍රහණයන් විදහා දක්වමින් සිදු කරනු ලබන වාර්තාවක්

V. නාම යෝජනාවක් නම් නාමිකයාගේ කැමැත්ත පළකරමින් දෙනු ලබන වාර්තාවක්.

VI. අයදුම්කරු / නාමිකයා රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක සහ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු අයෙකු නම් ඔහු / ඇය තනතුරට පත් කරනු ලැබුවහොත් ඔහු / ඇය (අයදුම්කරු / නාමිකයා) දැනට දරන තනතුරින් නිදහස් කිරීමට එකඟතාවය පළකරමින් සේවා යෝජකයා විසින් ලබාදෙනු ලබන ලිපියක්.

තෝරා ගැනීමේ ක්‍රමවේදය 2022 මැයි මස 23 වන දින දතම් හා අංක 10/2022 දරන කොමිෂන් සභා චක්‍රලේඛනයේ දී ඇති උපදෙස් ප්‍රකාරව සිදුවනු ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය හා PGIM ආඥා පනත පහත සඳහන් පරිදි බාගත කරගත හැකි වනු ඇත. පිළිවෙලින් https://www.ugc.ac.lk/index.php?option=com_content&view=article&id=2379%3Acommission-circular-no102022-appointment-of-the-post-of-director-of-an-institute&catid=185%3A-circulars-published-in-2022-012022-and-above&Itemid=20&lang=en and https://pgim.cmb.ac.lk/ordinance-pgim/respectively.

අයදුම්පත් / නාමයෝජනා මුද්‍රා තබන ලද ලිපි කවරයක බහා කොළඹ 07 මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවතේ, අංක 160 හි වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙ හි නියෝජ්‍ය ලේඛකාධිකාරී වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් ඉහත කාර්යාලයට, 2022 සැප්තැම්බර් මස 26 වන දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර එවිය යුතුය. එම ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ **"අධ්‍යක්ෂක තනතුර සඳහා අයදුම්පත / නාමයෝජනාව"** යනුවෙන් පැහැදිලිව සටහන් කරන ලෙස අයදුම්කරුවන්ට / නාමිකයින් හට උපදෙස් දෙනු ලැබේ.

අවසාන දිනයට පසුව ලැබෙන (ප්‍රමාද) හෝ ඉහත උපදෙස් වලට අනුකූල නොවන අයදුම්පත් / නාමයෝජනා භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත,**
**කොළඹ 07.**
**2022.09.11**